ප්‍රධාන ලේකම් / பிரதானசெயலாளர் / Chief Secretary } T:P - 0812223418, Fax - 0812223418

විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail } csecp1@gmail.com

කාර්යාලය / அலுவலகம் / Office } T:P - 0814953289/90, Fax - 0812239075

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site } www.cs.cp.gov.lk

# ප්‍රධාන ලේකම් කාර්යාලය - මධ්‍යම පළාත
# பிரதானசெயலாளர் அலுவலகம்- மத்தியமாகாணம்
# Chief Secretary's Office - Central Province

තැ.පෙ. 102, ප්‍රධාන ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ

த.பெ.102,பிரதானசெயலாளர் அலுவலகம், மத்தியமாகாண சபை கட்டிடத்தொகுதி, பல்லேகலை,குண்டசாலை

P.O Box 102, Chief Secretary's Office, Central Provincial Council Complex, Pallekele, Kundasale

මගේ අංකය / எனது இல / My No } CPC/CS/5-3/1/2(2024)

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2025.01. 16

ආණ්ඩුකාර ලේකම්,

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,

සභා ලේකම්,

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා

ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## මූල්‍ය ප්‍රකාශන - 2024

2018 වසරේ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 මගින් හඳුන්වා දෙන ලද මූල්‍ය ප්‍රකාශන සැකසීමේ ආකෘතිය මෙම මාර්ගෝපදේශය මගින් සංශෝධනය කරනු ලබන අතර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 16 සහ 38 වගන්තිවල ප්‍රතිපාදන සහ මූල්‍ය රීති යටතේ වාර්ෂික විසර්ජන ගිණුම සැකසීම සඳහා මූල්‍ය රීති අංක 97.2 සහ ආදායම් ගිණුම සැකසීම සඳහා මූල්‍ය රීති 97.5 යටතේ වන විධිවිධාන සහ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි 47 (2) වගන්තිය අනුව සෑම මූල්‍ය වාර්තාකරණ ආයතනයක් විසින්ම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුයි.

සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල (මූල්‍ය වාර්තාකරණ ආයතන) මෙම මාර්ගෝපදේශයට අනුව 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර 2018 අංක 19 දරන විගණන පනතට අනුව 2025 පෙබරවාරි 28 දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

ඒ සඳහා පහත පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

- සියළුම අමාත්‍යාංශ,සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ පළාත් පරිපාලන(544) යන ආයතන වලට අදාළව මූල්‍ය ප්‍රකාශන 2025.02.15 දිනට පෙර පිළියෙල කර අවසන් කළ යුතුය. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන 2025.02.17 දින අදාළ අමාත්‍යාංශයට යොමු කළ යුතු අතර, ප්‍රධාන ගණකාධිකාරි විසින් පරීක්ෂාකොට අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනට ඉදිරිපත් කළ යුතුය.
- අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතන මූල්‍ය ප්‍රකාශන 2025.02.10 වන දිනට පෙර පිළියෙල කර අවසන් කළ යුතුය.සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම 2025.02.10 දින තම ආයතනයට අදාලව පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන අදාළ අමාත්‍යාංශයට යොමු කළ යුතු අතර, ප්‍රධාන ගණකාධිකාරි/ගණකාධිකාරි විසින් එම මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කොට අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනට ඉදිරිපත් කළ යුතුය.

02. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.

2.1 සියලුම වාර්තාකරණ ආයතන 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් වෙන් වෙන් වශයෙන් හඳුන්වාදී ඇති ආකෘති වලට අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල මුද්‍රණය කළ යුතු ය.

2.2 ලබා දී ඇති සිඑස්ඕජ්-ඩී ආකෘතියට අනුව සෑම මූල්‍ය වාර්තාකරණ ආයතනයක් විසින්ම තම ආයතනයට අදාළ සහ අදාළ නොවන මූල්‍ය වාර්තාකරණ ආකෘති හඳුනාගත යුතු අතර එසේ හඳුනාගත් අදාළ වන මූල්‍ය වාර්තාකරණ ආකෘති පමණක් භාවිත කළ යුතුය.

03. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අවශ්‍ය සංඛ්‍යානමය දත්ත.

පහත සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

3.1 CIGAS ඩෙක්ස්ටොප් යෙදුම මඟින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම කිසිදු වෙනස් කිරීමකින් තොරව භාවිතා කර මූල්‍ය ප්‍රකාශන පිළියල කළ යුතු අතර එය ඇමුණුමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වලට අමුණා තිබිය යුතුය. මීට අමතරව, පළාත් භාණ්ඩාගාරය විසින් නිකුත් කළ අවසාන DPA වාර්තා මූල්‍ය ප්‍රකාශන වලට අමුණා තිබිය යුතුය.

3.2 වාර්තාකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සංඛ්‍යා, අවසාන පළාත් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන වල දක්වා ඇති ආදායම්, වියදම් සහ ප්‍රධාන ලෙජර් ශේෂයන් සමඟ එකඟවන බවට සහතික විය යුතුය. තව ද මූල්‍ය නොවන වත්කම්, තැන්පතු, අත්තිකාරම් ගිණුම් සහ අනෙකුත් අදාල ප්‍රධාන ලෙජර් ගිණුම්වල කේවළ ශේෂයන් අදාල පාලන ලෙජර් ශේෂවලට සමාන වන බවට සහතික විය යුතුය.

3.3 වාර්තාකරණ ආයතනයේ ඇති බැඳීම් සහ වගකීම් 2024/12/31 දිනට බැඳීම් අංක අනුව හෙළිදරව් කළ යුතුය. තවද මූ.රී 46.2.1 සහ 46.2.2 යටතේ එළඹෙන ලද බැඳීම් සහ වගකීම් වෙන වෙනම හෙළිදරව් කළ යුතුය.

3.4 එක් එක් වැය විෂයය සංකේතාංකයක් යටතේ සෑම වැය විෂයයක් වෙනුවෙන්ම මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර වෙනස හා එම වෙනසට හේතු සිඑස්ඕජ් 2 (ii) ආකෘතියෙහි දැක්විය යුතුය. මෙම වෙනස වැය විෂයයේ ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණයෙන් සියයට 5 ක් හෝ රු.10,000/- යන දෙකෙන් කවර හෝ වැඩි මුදලකට වඩා අඩු වන්නේ නම්, වෙනසට හේතු ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. විචලනයන් සඳහා පැහැදිලි කිරීම් සංක්ෂිප්ත විය යුතු අතර සාධාරණීයකරණය කිරීමට අවශ්‍ය කරුණු ඇතුළත් විය යුතුය.

3.5 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුත්තේ සිඑස්ඕජ්-1 සිට සිඑස්ඕජ්-7 දක්වා වූ ආකෘතින්හි ඇතුළත් තොරතුරු හා සටහන් අංක (i) සිට (viii) දක්වා වූ විස්තර පදනම් කරගෙනය. මෙහිදී අදාල ආකෘතින් එක් එක් වැඩසටහන් සඳහා වෙන වෙනම පිළියෙල කර ඒවායේ ඒකාබද්ධ අගයන් පමණක් අවසන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතුවේ.

3.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියලුම අගයන් ආසන්න රුපියලට වාර්තා කළ යුතුය.

04 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.</u>**

4.1 මූ.රි 97.2 (විසර්ජන ගිණුම) සහ මූ.රි 97.5 (ආදායම් ගිණුම) අනුව ප්‍රමාණවත් තොරතුරු සහිතව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම එක් එක් වාර්තාකරණ ආයතනයේ (වියදම් ශීර්ෂයේ) ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහ ගණන්දීමේ නිලධාරිගේ/ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. ප්‍රධාන ගණකාධිකාරි/ ගණකාධිකාරි/ මූල්‍ය අංශ ප්‍රධානි විසින් අදාල මූල්‍ය ප්‍රකාශනවල ඇති විස්තර අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන සමඟ එකඟ වන බවට සහතික කළ යුතුය.

4.2 ආකෘති පත්‍රයන්හි නිශ්චිතවම සඳහන් කර ඇති විට පමණක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන්දීමේ නිලධාරි/ ආදායම් ගණන්දීමේ නිලධාරි විසින් අදාල වන පරිදි එම ආකෘතිවල අත්සන් කළ යුතු අතර සියලුම ආකෘති පත්‍ර සඳහා ප්‍රධාන ගණකාධිකාරි/ ගණකාධිකාරි/ මූල්‍ය අංශ ප්‍රධානි විසින් අත්සන් යොදා තිබිය යුතුය.

05 **<u>මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ආදර්ශ අකෘතිපත් ලබා ගැනීම.</u>**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ඊට අදාළ උප ආකෘතීන් පළාත් භාණ්ඩාගාරය විසින් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා යොමු කළ ආකෘති පත්‍ර වල "2023" යන්න "2024" ලෙස සංශෝධනය කර සකසා ගත යුතුය.

06 **<u>මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා භාවිතා කළ යුතු ආදර්ශ ආකෘති පත්‍ර.</u>**

මේ සමඟ අමුණා ඇති පහත සඳහන් ආකෘතිවල ආදර්ශයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා භාවිතා කළ යුතුය.

| | | |
|---|---|---|
| සීඑස්සීඒ(එෆ්) | - | 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය |
| සීඑස්සීඒ-(පී) | - | 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය |
| සීඑස්සීඒ-(සී) | - | 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (මුදල් සහ හරස් සටහන් යන දෙකම සැළකිය යුතුය) |
| සීඑස්සීඒ-(ඩී) | | වාර්තාකරන ආයතනය සඳහා අදාළ ආකෘතීන් සහ ඇමුණුම් විස්තරය වාර්තා කිරීමේ පදනම |
| සීඑස්සීඒ-1 | - | 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය |
| සීඑස්සීඒ-1(i) | - | 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනය |
| සීඑස්සීඒ-1(ii) | - | මූලික ආදායම් ඇස්තමේන්තුව සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර විචලතා පැහැදිලි කිරීම. |
| සීඑස්සීඒ-1(iii) | - | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ සත්‍ය ආදායම් අතර විචලතා පැහැදිලි කිරීම |

සිඑස්සිඒ-2 - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

සිඑස්සිඒ -2(i) - වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනය

සිඑස්සිඒ -2(ii) - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

සිඑස්සිඒ -2(iii) - මූලික හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර විචලතා පැහැදිලි කිරීම

සිඑස්සිඒ-2(iv) - වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය

සිඑස්සිඒ-2(v) - එක් එක් වැඩසටහන් යටතේ ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණය

සිඑස්සිඒ-3 - 2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම පිළිබඳ ප්‍රකාශනය

සිඑස්සිඒ-4 - 2024 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම පිළිබඳ ප්‍රකාශනය

සිඑස්සිඒ-5 - 2024 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම පිළිබඳ ප්‍රකාශනය

සිඑස්සිඒ-5(ඒ) - 2024 දෙසැම්බර් 31 දිනට කුළී හා වැඩ අත්තිකාරම් ගිණුම පිළිබඳ ප්‍රකාශනය

සිඑස්සිඒ-5(බී) - 2024 දෙසැම්බර් 31 දිනට කුළී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම පිළිබඳ ප්‍රකාශනය

සිඑස්සිඒ-6 - මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය (2024)

සිඑස්සිඒ-7 - අග්‍රිම ගැලපුම් පිළිබඳ ප්‍රකාශනය

සටහන -(i) - පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය (මූ.රී 54 හා මූ.රී 62 යටතේ වන පාඩු)

සටහන -(ii) - පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

සටහන -(iii) - බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය

සටහන -(iv) - බැරකම් පිළිබඳ ප්‍රකාශනය-(i) මූ.රී. 46 (2.1 ) හා 46(2.2) ප්‍රකාරව බැරකම් වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය

සටහන -(v) - බැරකම් පිළිබඳ ප්‍රකාශනය (ii) මූ.රී 146(3.3) සහ (3.4) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරුකරන ලද ප්‍රතිපාදන

| | | |
|---|---|---|
| සටහන -(vi) | - | ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර වලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශනය |
| සටහන -(vii) | - | අස්ථානගත චවුචර් පිළිබඳ ප්‍රකාශනය |
| සටහන -(viii) | - | බැංකු ගිණුම් පිළිබඳ 2024.12.31 දිනට තත්ත්ව වාර්තාව |
| ඇමුණුම 01 | - | CIGAS ඩෙස්ක්ටොප් ගොනුව මගින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම සහ භාණ්ඩාගාර අවසාන ගිණුම් වාර්තා (DPA වාර්තා) |

6.1 ඉහත ආකෘති පිළියෙල කර ඇත්තේ පොදුවේ සියලුම වාර්තාකරණ ආයතනයන් සඳහා වේ. කෙසේ වුව ද, යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම තොරතුරු ඇතුළත් කර ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකරගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

6.2 ඉහත සඳහන් ආකෘති පත්‍ර තම වාර්තාකරණ ආයතනයට අදාළ වන ලෙස පහත පරිදි භාවිතා කළ යුතු ය.

| ආකෘති පත්‍ර අංකය | සංශෝධන |
|---|---|
| සිඑස්සිජී - 1<br>සිඑස්සිජී - 1(i),<br>සිඑස්සිජී - 1(ii),<br>සිඑස්සිජී - 1(iii) | ආදායම් ගණන්දීමේ නිලධාරින් පමණක් මෙම ආකෘති පත්‍රය පිරවීම ප්‍රමාණවත් වේ.<br>තමන්ට අදාළ ආදායම් සංකේතය පමණක් ඇතුළත් වන පරිදි ආකෘති පත්‍රය සංශෝධනය කරගත යුතුය. |
| සිඑස්සිජී - 2(i),<br>සිඑස්සිජී - 2(ii),<br>සිඑස්සිජී - 2(iii) | අදාළ වැය විෂයන් පමණක් ඇතුළත් කර ආකෘතිය සංශෝධනය කරගත යුතුය. |
| සටහන - (i),<br>සටහන - (ii),<br>සටහන - (vii) | තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. |
| සටහන - (v),<br>සටහන - (vi) | තම වාර්තාකරණ ආයතනයට අදාළ නම් පමණක් ආකෘතිය භාවිතා කළ යුතුය. |

## 07 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා වූ මඟපෙන්වීම

2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පහත සඳහන් පියවර අනුගමනය කළ යුතු වේ.

7.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සිඑස්සිජී-1, සිඑස්සිජී-2, සිඑස්සිජී-2(i), සිඑස්සිජී-2(ii), සිඑස්සිජී-3, සිඑස්සිජී-

4 , සිඑස්සිඒ-5, සිඑස්සිඒ-5(ඒ), සිඑස්සිඒ-5(බි) සහ සිඑස්සිඒ-6 සහ සිඑස්සිඒ-7 යන අකෘතින් වල ඇතුළත් තම වාර්තාකරණ ආයතනයට අදාළ තොරතුරු සැළකිල්ලට ගත යුතුය.

7.2 වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරින් වෙනුවෙන්, වාර්තාකරණ ආයතනය විසින් එකතුකරන ලද ආදායම මූලා කාර්යසාධන ප්‍රකාශනයට ( සිඑස්සිඒ -එෆ්) ඇතුළත් නොකළ යුතු අතර එම ආදායම අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය තුළ ගැලපිම් කළ යුතුය.

7.3 මූලා කාර්යසාධන ප්‍රකාශනයෙහි "අනෙකුත් ප්‍රධාන ලෙජරවල" ( Other Main ledgers) ලැබීම් හා ගෙවීම් සටහන් කළ යුත්තේ අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරින්/ ගණන් දීමේ නිලධාරින් පමණි.

7.4 මූලා කාර්යසාධන ප්‍රකාශනයේ සීඑස්සිඒ(එෆ්) "භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණ" යටතේ දක්වන අගයෙහි (අයිතමය 'ඇ') වසර තුළ සහ වසර අවසානයේදී පළාත් භාණ්ඩාගාරය වෙත කරන ලද ප්‍රේෂණ ඇතුළත් විය යුතුය.

7.5 2024 දෙසැම්බර් 31 වැනි දිනට මූලා කාර්යසාධන ප්‍රකාශනයේ ශේෂය (අයිතමය 'ඒ') අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂයේ සහ වසර අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතුය.

7.6 මූලා කාර්යසාධන ප්‍රකාශනයේ(සිඑස්සිඒ -එෆ්) "සංශෝධිත අයවැය ප්‍රතිපාදන" තීරුවට, වාර්ෂික අයවැය ප්‍රතිපාදන වලට මු.රී. 30 හා 32 මාරු කිරීම් හා පරිපූරක ප්‍රතිපාදන හා පවරා ගැනීම් ගැලපීමෙන් පසු අගය යොදා ගත යුතුය.

7.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මුදල් සහ හරස් සටහන් යන දෙකම සැළකිල්ලට ගෙන සෘජු ක්‍රමය භාවිතා කරමින් පිළියෙල කළ යුතුය.

7.8 දේපල පිරියත හා උපකරණවල අගයට සමාන වටිනාකමක් මූලා තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සිඑස්සිඒ-(පි) ශුද්ධ වත්කම් /ස්කන්ධ යටතේ සංචිතයක් ලෙස දැක්විය යුතුය.

7.9 වාර්තාකරණ ආයතනයේ අත්තිකාරම් ගිණුම්වල වටිනාකමින්, තැන්පතු ගිණුම්වල වටිනාකම අඩු කිරීමෙන් මූලා තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ ඇති "පළාත් භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් " අගය ගණනය කළ යුතුය.

7.10 මූලා කාලසීමාව අවසානයේ එක් එක් වාර්තාකරණ ආයතනය විසින් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද මුදල් ශේෂය මූලා තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මුදල් සහ මුදල් සමාන දෑ හි ශේෂයට ඇතුළත් නොකළ යුතුය.

7.11 අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය පිළියෙල කිරීමේදී පහත සඳහන් ගනුදෙනු සළකා බැලිය යුතුය. (සිඑස්සිඒ-7)

- වෙනත් ආයතන විසින් වර්තාකරණ ආයතනය වෙනුවෙන් (ආදායම් ගණන් දීමේ නිලධාරි) එකතු කරන ලද ආදායම.
- වෙනත් අයතන විසින් වාර්තාරකණ අයතනය වෙනුවෙන් (වියදම් ශිර්ෂය) දරණ ලද වියදම්.

➢ අත්තිකාරම් බී ගිණුමේ ගනුදෙනු

ගෙවීම් - වාර්තාකරණ ආයතනය වෙත මාරුවී පැමිණෙන නිලධාරීන් වෙනුවෙන් පවරාගත් ණය

ලැබීම් - වාර්තාකරණ ආයතනයෙන් පිටතට මාරු කිරීම් වලදී පවරා දුන් ණය

➢ අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන්, වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම

➢ අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් (මු.රී 140 අනුව)

08 පොදු උපදෙස්.

8.1 මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් නිකුත් කළ 2013.07.12 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛ ලිපිය මගින් වත්කම් වර්ගීකරණය කර ඊට අදාළ සංකේතාංක ලබා දී ඇති අතර ඒ අනුව වත්කම් ගිණුම්ගත කිරීම සිදු කළ යුතුය.

8.2 තවදුරටත් වාර්තා කළ යුතු මූල්‍ය නොවන වත්කම් තිබේනම් ඒවා නිසිපරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි අවස්ථාවලදී තක්සේරු කළ අගයට ගිණුම්ගත කළ යුතුය.

8.3 තැන්පතු හා අත්තිකාරම් ගිණුම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ආකෘති අංක සීඑස්සීජේ-4 සීඑස්සීජේ-5 ආකෘති මගින් සැපයිය යුතුය. මීට අමතරව අත්තිකාරම් කටයුතු සම්බන්ධයෙන් වන ගිණුම් පිලියෙළ කර 2025 පෙබරවාරි 28 වන දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

8.4 2024 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන එම මූල්‍ය ප්‍රකාශනවලට අදාළව විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණයන් සමඟ වාර්තාකරණ ආයතනය විසින් තම වෙබ් අඩවිය යටතේ ප්‍රකාශයට පත් කළ යුතුය.

8.5 අවසාන මූල්‍ය දත්ත ඔබගේ විද්‍යුත් තැපැල වෙත 2025 ජනවාරි 24 වන දින හෝ ඊට පෙර යොමු කරනු ලැබේ.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ගිණුම් ඉදිරිපත් කිරීම.

මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ශීර්ෂ 544 යටතේ මධ්‍යම පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙනු ලබයි. ඒ අනුව ශීර්ෂ 544 ට අදාල 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නියමිත ආකෘති පත්‍රවලට අනුව සකස් කර 2025 පෙබරවාරි 28 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතුව ඇත. ඒ සඳහා සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල තොරතුරු එක්රැස් කර මෙම ගිණුම සැකසීම මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ලබයි. ඒ සඳහා අදාල ආකෘති පත්‍ර අන්තර්ගත කොට පළාත් භාණ්ඩාගාරය විසින් ලබා දුන් ආකෘතින් අනුව ඔබ ආයතනයට අදාලව සකසන ලද මූල්‍ය ප්‍රකාශනයේ පහත සඳහන් ආකෘතින් භාෂා තුනෙන්ම සකසා එක් භාෂාවකින් පිටපත් 03 බැගින් අදාල ස්ථාන වල නියමිත නිලධාරීන් විසින් අත්සන් කර නිල මුද්‍රාව තබා 2025.02.05 දිනට පෙර මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සහකාර

අධ්‍යක්ෂ (ගෙවීම්)(දුරකථන අංක 081-2424691) වෙත ලැබීමට සැලැස්විය යුතුය. (මෙම ගිණුම 2025.02.15 දිනට ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුව ඇත.)

- CSCA - F,CSCA -C,CSCA -P,CSCA -3,CSCA -4 ,CSCA -5
- NOTE (i), NOTE (ii), NOTE (vii), NOTE (viii)

ඉහත ආකෘතිපත්‍ර වලට අමතරව ඔබ ආයතනයට අදාලව සම්පූර්ණ කිරීම සඳහා කිසියම් තොරතුරක් තිබේ නම් පමණක් එම ආකෘතිපත්‍රය සම්පූර්ණ කර ඉහත ආකෘතිපත්‍ර සමග භාෂා තුනෙන්ම සකසා එක් භාෂාවකින් පිටපත් 03 බැගින් නියමිත දිනට පෙර අදාල අත්සන් යොදා ඉදිරිපත් කළ යුතුය.

- අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය (සිංහල භාෂාවෙන් පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය)

<u>විගණකාධිපතිවරයා වෙත ගිණුම් ඉදිරිපත් කිරීම</u>

විගණකාධිපතිවරයා වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී පහත දැක්වෙන පියවර අනුගමනය කළ යුතුවේ.

I නිසි පරිදි සහතික කිරීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශනයන්හි භාෂා තුනෙන් මුල් පිටපත හා එක් එක් භාෂාවකින් තවත් පිටපත් දෙක බැගින් 2025 පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

II විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා විසින් පහත පරිදි බෙදා හරිනු ඇත.

i. මුල්පිටපත - ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව -මධ්‍යම පළාත
ii. දෙවන පිටපත -වැය ශීර්ෂය අයත් අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව
iii. තෙවන පිටපත -ජාතික විගණන කාර්යාලය

මෙම මාර්ගෝපදේශයෙහි සඳහන් තොරතුරු සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍යවන්නේ නම් ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) (දුරකථන අංක 081-2424693) හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගිණුම්) (දුරකථන අංක 081-2424690) ඇමතීමෙන් ලබා ගත හැක.

පී.එච්.එම්.ඒ. ප්‍රේමසිංහ
ප්‍රධාන ලේකම්
මධ්‍යම පළාත

පිටපත්-
1.විගණකාධිපති දැ.ගැ පි.
2.අධ්‍යක්ෂ (අයවැය), මධ්‍යම පළාත දැ.ගැ පි.
3.අධ්‍යක්ෂ (මුදල්), මධ්‍යම පළාත දැ.ගැ පි.
4.පළාත් විගණන අධ්‍යක්ෂ, මධ්‍යම පළාත දැ.ගැ පි.